1

# එක්සත් ජනරජ පෙරමුණ

## ව්‍යවස්ථාව

**පළමුවන පරිච්ඡේදය**

**01.** පක්ෂයේ නම: "එක්සත් ජනරජ පෙරමුණ" වේ. (එය මින් පසු පක්ෂය යනුවෙන් සඳහන් කරනු ලැබේ.) මෙය ද්‍රවිඩ බසින් **ஐக்கிய குடியரசு முன்னணி** ලෙසද, ඉංග්‍රීසි බසින් **UNITED REPUBLIC FRONT** ලෙසද හැඳින්වේ.

**02.** පක්ෂයේ ලාංඡනය: පළමු උපලේඛනය දැක්වෙන පරිදි "පැන්සල" වේ. තත්කාලීන මැතිවරණ නීතිය අනුව පක්ෂ ලාංඡනය වෙනස් කිරීමට පක්ෂයේ මධ්‍යම කාරක සභාවට බලය පවරනු ලැබේ.

**03.** පක්ෂයේ ප්‍රතිඥාව: පක්ෂයේ සෑම සාමාජිකයෙකුම මෙහි දෙවන උපලේඛනයේ දැක්වෙන අංක 01 යටතේ ඇති ප්‍රතිඥාව ලබාදිය යුතුය. පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරු, පළාත් සභා මන්ත්‍රීවරු ඇතුළු සියලු මහජන නියෝජිතයන් දෙවන උපලේඛනයේ අංක 02 යටතේ දැක්වෙන ප්‍රතිඥාව ලබාදිය යුතුය.

**දෙවන පරිච්ඡේදය**

**04.** පක්ෂයේ දැක්ම: පුරවැසියන්ගේ කුසලතාවයන්ට මුල්තැනදී ශ්‍රී ලාංකිකයන් ආර්ථිකමය, සාමාජීය හා තාක්ෂණික වශයෙන් බලගැන්වීම තුළින් තිරසර, බලසම්පන්න ශ්‍රී ලංකාවක් ගොඩ නැගීම.

**05.** පක්ෂයේ ප්‍රතිපත්ති:

05.1. රාජ්‍ය පාලනයේ දී දේශපාලනය තුළ සහ පුද්ගල සංවර්ධනයේ දී අවංකබව, විවෘතබව, ප්‍රායෝගිකත්වය, සහකම්පනය සහ කුසලතාවය යන සමාජ හා පුද්ගල වටිනාකම් මත පදනම්ව ශ්‍රී ලංකා රාජ්‍යය ගොඩනැගීම.

05.2. නිදහස, ප්‍රජාතන්ත්‍රවාදය, සමානාත්මතාවය, යුක්තිය හා පුද්ගල කුසලතාවයන් මත පදනම්ව නීතියේ ආධිපත්‍යය මත ක්‍රියාත්මක වන ශ්‍රී ලංකාවක් බිහි කිරීම.

## තුන්වන පරිච්ඡේදය

### 06. පක්ෂ සාමාජිකත්වය:

**06.1.** පක්ෂ සාමාජිකත්වය ලබා ගැනීම:

06.1.1. වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකයකු නොවන, පක්ෂයේ ව්‍යවස්ථාව හා එහි අරමුණු පිළිගෙන පක්ෂ ප්‍රතිඥාව ලබාදෙන, වයස අවුරුදු 18 සම්පූර්ණ කළ ඕනෑම පුද්ගලයෙකු පක්ෂ සාමාජිකත්වය ලබා ගැනීමට සුදුස්සෙකු වන්නේය.

06.1.2. යම් වෙනත් දේශපාලන පක්ෂයක සාමාජිකත්වය දරනු ලබන අයෙකු, එකී දේශපාලන පක්ෂයෙන් ඉවත් වූ බවට සනාථ කරන ලිඛිත ප්‍රකාශයක් කර ඇත්නම් ඔහුට ද පක්ෂ සාමාජිකත්වය ලබා ගැනීමට අයදුම් කළ හැක.

06.1.3. පක්ෂ සාමාජිකත්වය අපේක්ෂා කරන අය විසින් ඒ සඳහා මධ්‍යම කාරක සභාව විසින් අනුමත කර ඇති අයදුම්පත පුරවා ඒ සමග වාර්ෂික සාමාජික ගාස්තුව ගෙවිය යුතුය.

06.1.4. වාර්ෂික පක්ෂ සාමාජික ගාස්තුව මධ්‍යම කාරක සභාව විසින් තීරණය කර සාමාජිකත්වය අයදුම්පතේ සඳහන් කළ යුතුය.

06.1.5. ඕනෑම ඉල්ලුම්කරුවෙකුගේ පක්ෂ සාමාජිකත්වය සඳහා වූ අයදුම්පතක් ප්‍රතික්ෂේප කිරීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

06.1.6. යම් පුද්ගලයෙකුට පක්ෂ සාමාජිකත්වය ලබා දුන්නේ නම්, එකී සාමාජිකයාට සාමාජික කාඩ්පතක් නිකුත් කළ යුතුය.

06.1.7. පක්ෂය විසින් ඉදිරිපත් කරන නාමයෝජනා පත්‍රයකට අත්සන් තබන ඕනෑම අයෙකු පක්ෂ සාමාජිකත්වය ලබා ගත යුතුවේ.

06.1.8. යම් සාමාජිකයෙකුට වර්ෂ 10 ක සාමාජික මුදල් එකවර ගෙවීමෙන් යාවජීව සාමාජිකයෙකු බවට පත් විය හැක.

06.1.9. යාවජීව සාමාජිකයෙකු වුවද පක්ෂ විනයට යටත් වන අතර, පක්ෂ විනය කඩ කිරීමට ඔහු වරදකරු වුවහොත් පක්ෂ සාමාජිකත්වයෙන් ඔහු නෙරපීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

**06.2.** පක්ෂය සාමාජිකයෙකුගේ යුතුකම් හා වගකීම්ඃ

06.2.1. පක්ෂ ව්‍යවස්ථාවට සහ ඒ යටතේ කලින් කලට පනවනු ලබන සියලුම රීති වලට යටත්ව කටයුතු කිරීම.

06.2.2. පක්ෂයේ දේශපාලන මණ්ඩලය සහ මධ්‍යම කාරක සභාව ඇතුළු නිල ආයතන විසින් කරන නියෝග පිළිපැදීම.

06.2.3. පක්ෂයේ අරමුණු සහ ප්‍රතිපත්ති පිළිගෙන පක්ෂය දිවුරුමට අත්සන් තැබීම.

06.2.4. පක්ෂයේ අරමුණු හා ප්‍රතිපත්ති, තීරණ සහ ක්‍රියාකාරකම් ප්‍රසිද්ධියේ විවේචනය කිරීම හෝ පක්ෂයේ අරමුණු හා ප්‍රතිපත්ති තීරණවලට පටහැනි මත ප්‍රසිද්ධියේ කුමන ආකාරයකින් හෝ පළ කිරීමෙන් වැළකීම.

06.2.5. යම් මැතිවරණයක දී හෝ ඡන්ද විමසීමක දී පක්ෂය විසින් නම් කරනු ලබන අපේක්ෂකයින්ට හැකි උපරිම අයුරින් සහාය පළ කිරීම සහ වෙනත් තරගකාරී අපේක්ෂකයින්ට සහය පළ කිරීමෙන් වැළකී සිටීම.

06.2.6. යම් මැතිවරණයක දී හෝ ඡන්ද විමසීමකදී පක්ෂය විසින් අපේක්ෂකයන් නම් නොකර ඇති අවස්ථාවක පක්ෂය නිල වශයෙන් වෙනත් යම් අපේක්ෂකයෙකුට සහාය පළකරන්නේ නම් පමණක් එකී අපේක්ෂකයාට සහාය පළ කළ යුතු අතර, මධ්‍යම කාරක සභාව විසින් දෙනු ලබන විධානයන්ට අනුකූලව ක්‍රියා කිරීම.

06.2.7. පක්ෂයේ අරමුණු හා ප්‍රතිපත්ති සමග ගැටෙන හෝ ගැටීමට ඉඩ ඇති යම් දේශපාලන හෝ වෙනත් කටයුත්තකට සහභාගි වීමෙන් හෝ සහාය පළ කිරීමෙන් වැළකී සිටීම.

06.2.8. පක්ෂය අපකීර්තියට පත් වන අයුරින් ක්‍රියා නොකිරීම.

06.3. පක්ෂ සාමාජිකයෙකුගේ බලතල සහ අයිතිවාසිකම්ං

06.3.1. පක්ෂය විසින් නියම කරන යම් ගාස්තුවක් වෙතොත් එකී ගාස්තුව ගෙවා පක්ෂයේ ව්‍යවස්ථාව හෝ ප්‍රතිපත්ති ප්‍රකාශයේ පිටපතක් ලබා ගැනීම.

06.3.2. ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පක්ෂ සම්මේලනයට සහභාගි වීම.

06.3.3. ව්‍යවස්ථාවේ 10 වෙනි වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පක්ෂ සම්මේලනයක් කැඳවන මෙන් ඉල්ලීම.

06.3.4. ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පක්ෂ සම්මේලනයක දී ඡන්දය ප්‍රකාශයට පත් කිරීම.

06.3.5. ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව පක්ෂ සම්මේලනයකට යෝජනා ඉදිරිපත් කිරීම.

06.3.6. පක්ෂ ව්‍යවස්ථාවට අනුකූලව පත් කරනු ලබන පක්ෂයේ එක් නිලයක් හෝ වැඩි ගණනක් දැරීම.

06.3.7. මැතිවරණයන් හිදී පක්ෂයේ අපේක්ෂකයෙකු ලෙස ඉදිරිපත් වීම.

06.4. මතු දැක්වෙන අවස්ථා එකක්, කිහිපයක් හෝ සියල්ලම යම් සාමාජිකයෙකු අරභයා මතු වුවහොත් එකී අවස්ථාව උද්ගත වන මොහොතේ ම එකී සාමාජිකයාගේ පක්ෂ සාමාජිකත්වය අහෝසි වන්නේය.

06.4.1. ඉහත 6.1.2. දැක්වෙන ආකාරයට වෙනත් පක්ෂයක සාමාජිකත්වය දරමින් සිටියදී පක්ෂ සාමාජිකත්වය ලබාගෙන දින 30ක් ඇතුළත ඔහු අදාල දේශපාලන පක්ෂයෙන් ඉවත් නොවීම.

06.4.2. යම් වර්ෂයක මාර්තු තිස් එක් වන දිනට පෙර වාර්ෂික සාමාජික මුදල් ගෙවීම පැහැර හැරීම.

06.4.3. වෙනත් දේශපාලන පක්ෂයක හෝ දේශපාලන සන්ධානයක සාමාජිකත්වය හෝ නිලතල ලබා ගැනීම.

06.4.4. මධ්‍යම කාරක සභාවේ පූර්ව ප්‍රකාශිත ලිඛිත අවසරයකින් තොරව පක්ෂය නියෝජනය කරමින් දේශපාලන සන්ධානයකට එක්වීම.

06.4.5. මධ්‍යම කාරක සභාවේ පූර්ව ප්‍රකාශිත ලිඛිත අවසරයකින් තොරව වෙනත් දේශපාලන පක්ෂයක් හෝ දේශපාලන සන්ධානයක් හෝ ස්වාධීන කණ්ඩායමක් හෝ තමන්ව නියෝජනය කරමින් ජනාධිපති ධූරය හෝ මහජන නියෝජිත මණ්ඩලයක සභික ධූරයක් ලබා ගැනීම සඳහා තරඟ කිරීමට නාමයෝජනා ලබා ගැනීම.

06.4.6. මධ්‍යම කාරක සභාවේ පූර්ව ප්‍රකාශිත ලිඛිත අවසරයකින් තොරව ජාතික ලැයිස්තුව හෝ වෙනත් ක්‍රමයකින් වෙනත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායමක් නියෝජනය කරමින් මහජන නියෝජිත මණ්ඩලයක සභික ධූරයක් ලබා ගැනීම.

06.4.7. මධ්‍යම කාරක සභාවේ පූර්ව ප්‍රකාශිත ලිඛිත අවසරයකින් තොරව පක්ෂය විසින් සෘජුව හෝ සන්ධානගතව නො පිහිටුවන ලද ආණ්ඩුවක, පළාත් සභාවක, නගර සභාවක, ප්‍රාදේශීය සභාවක හෝ වෙනත් මහජන නියෝජිත ආයතනයක ජනාධිපති, අගමැති, කතානායක, ඇමති, නියෝජ්‍ය ඇමති, නගරාධිපති, නියෝජ්‍ය නගරාධිපති, සභාපති, නියෝජ්‍ය සභාපති, හෝ වෙනත් එවැනි තනතුරක් භාර ගැනීම.

06.4.8. මධ්‍යම කාරක සභාවේ පූර්ව ප්‍රකාශිත ලිඛිත අවසරයකින් තොරව පක්ෂය විසින් ඍජුව හෝ සන්ධානගතව නොපිහිටුවන ලද ආණ්ඩුවක් මගින් පාලනය වන සංස්ථාවක, ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ වෙනත් එවැනි ආයතනයක සභාපති, ක්‍රියාකාරී අධ්‍යක්ෂක, අධ්‍යක්ෂක, සභික,හෝ සමාගමක උපදේශක සභාවක හෝ ජාත්‍යායන්තර සංවිධානයක තනතුරක් භාර ගැනීම.

06.5. පක්ෂ සාමාජිකත්වයට අදාල රීතීන් කලින් කලට මධ්‍යම කාරක සභාව විසින් පනවනු ලබන්නේය.

06.6. යම් සාමාජිකයෙකු ඉල්ලා අස්වීමෙන්, අස් කිරීමෙන්, සාමාජිකත්වය අහෝසි වීමෙන් හෝ වෙනත් ආකාරයකින් සාමාජිකත්වය අහිමි වුවහොත්, ඔහු විසින් පක්ෂයේ දැරූ තනතුරු ද පක්ෂය නියෝජනය කරමින් දැරූ තනතුරුද ඉබේම අහෝසි වනු ඇත. ඒ සම්බන්ධයෙන් යම් පාර්ශවයකට හෝ ආයතනයකට හෝ සංවිධානයකට දැනුම් දිය යුතු නම් පක්ෂ ප්‍රධාන ලේකම් විසින් එය නොපමාව කළ යුතුය.

<u>හතරවන පරිච්ඡේදය</u>

## 07. විනය:

07.1. යම් සාමාජිකයෙකු විසින් මින් මතු දක්වන ක්‍රියා එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම කර ඇතැයි විනය කමිටුවේ පරීක්ෂණ සභාවකින් ඔප්පු වුවහොත් එම සාමාජිකයා පක්ෂයේ විනය කඩ කිරීමට වරදකරු වේ.

07.1.1. පක්ෂ ව්‍යවස්ථාව චේතාන්විතව කඩ කිරීම.

07.1.2. පක්ෂයේ නිල ආයතන විසින් ගන්නා තීරණයන්ට පටහැනිව කටයුතු කිරීම.

07.1.3. පක්ෂයේ නිල ආයතන විසින් කරනු ලබන නියෝග පිලිනොපැදීම.

07.1.4. පක්ෂයේ ප්‍රතිපත්ති හා වටිනාකම් වලට පටහැනි වන ආකාරයෙන් වෙනත් දේශපාලන පක්ෂයක් හෝ යම් දේශපාලන සංවිධානයක් විසින් සංවිධානය කළ රැස්වීමකට, උද්ඝෝෂණයකට පෙළපාලියකට හෝ වෙනත් එවැනි කටයුත්තකට පක්ෂයේ සභාපති, ප්‍රධාන ලේකම් හෝ වෙනත් එවැනි බලය පවරන ලද නිලධාරියෙක් යන අයගෙන් කවරෙකුගේ හෝ ලිඛිත අවසරයක් ලබා නොගෙන සහභාගී වීම.

07.1.5. යම් මැතිවරණයක දී හෝ ඡන්ද විමසීමකදි පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ පූර්ව ලිඛිත අවසරයකින් තොරව වෙනත් පක්ෂයකට හෝ වෙනත් පක්ෂයක අපේක්ෂකයෙකුට සහය පළ කිරීම.

07.1.6. පක්ෂයේ අරමුණු හා ප්‍රතිපත්ති, තීරණ සහ ක්‍රියාකාරකම් ප්‍රසිද්ධියේ විවේචනය කිරීම හෝ පක්ෂයේ අරමුණු හා ප්‍රතිපත්ති තීරණ වලට පටහැනි අන්දමින් කුමන ආකාරයකින් හෝ ප්‍රසිද්ධියේ මත පළ කිරීමෙන් වැළකීම. මෙහිලා ප්‍රසිද්ධ යන්නට මුද්‍රිත, ඉලෙක්ටොනික, සමාජ මාධ්‍යය හා සමාජ ජාලා වැනි පක්ෂ සාමාජිකත්වයෙන් පිටස්තර දෙදෙනෙකුට වැඩි පිරිසකට තොරතුරු සන්නිවේදනය වන ඕනෑම මාධ්‍යයක් අයිතිවේ.

07.1.7. පක්ෂය අපකීර්තියට පත්වන ආකාරයෙන් හැසිරීම.

07.2. යම් සාමාජිකයෙකු විසින් විනය කඩ කර ඇති බවට විශ්වාසනීය තොරතුරු මධ්‍යම කාරක සභාවට පැමිණිල්ලක් මගින් හෝ අන් ආකාරයකට ලැබී ඇති විට, ඒ තොරතුරු විමර්ශනය කර වාර්තා කිරීම සඳහා විනය කමිටුවට ප්‍රධාන ලේකම් විසින් ලිඛිතව දැනුම්දිය යුතුය.

07.3. විනය කමිටුව:

07.3.1. පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ නිර්දේශය අනුව වාර්ෂික පක්ෂ සම්මේලනයෙන් අනතුරුව පවත්වන ප්‍රථම මධ්‍යම කාරක සභාවේ දී පස් දෙනෙකුට නොඅඩු ස්ථිර විනය කමිටුවක් පත් කළ යුතුය.

07.3.2. පක්ෂ නායක හා ප්‍රධාන ලේකම් නිල බලයෙන් මෙහි සාමාජිකයන් වේ.

07.3.3. විනය පරීක්ෂණ කමිටුවේ සාමාජිකයන් අතුරින් එක් අයෙකු එහි සභාපතිවරයා ලෙස විනය කමිටුව විසින් පත් කළ යුතුය.

07.3.4. විනය කමිටුවට යම් පැමිණිල්ලක් ලැබුණු විට එකී චෝදනාව විමර්ශනය කර මධ්‍යම කාරක සභාවට වාර්තා කිරීම සඳහා විනය කමිටුවේ සාමාජිකයන් අතරෙන් තිදෙනෙකුගෙන් යුත් පරීක්ෂණ සභාවක් මධ්‍යම කාරක සභාවේ අණ පරිදි ප්‍රධාන ලේකම් විසින් පත් කළ යුතු ය.

07.3.5. විනය පරීක්ෂණ සභාවට පත් කළ බවට එහි සාමාජිකයන්ට දැනුම් දෙන ලිපියේ චූදිත සාමාජිකයාගේ නම සහ ලිපිනය ද විනය පරීක්ෂණ සභාවේ වාර්තාව දින 50ක් ඇතුලත මධ්‍යම කාරක සභාවට යොමු කළ යුතු බවද සඳහන් කළ යුතුය.

07.3.6. චූදිත සාමාජිකයාට එරෙහිව ඇති චෝදනා සම්බන්ධයෙන් ලැබී ඇති තොරතුරු ද එකී ලිපිය සමග විනය පරීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයන්ට ලබා දිය යුතුය.

07.4. එකී විනය පරීක්ෂණය සභාව විසින් සාමාජිකයාට එරෙහිව ඇති තොරතුරු ඇතුළත් චෝදනා පිළිබඳ සුදුසු යැයි සැලකෙන පරිදි පරීක්ෂණ කටයුතු සිදුකරමින් එකී චෝදනා පිළිබඳව තොරතුරු රැස් කළ යුතුය.

07.5. එකී සාමාජිකයාට එරෙහිව විනය කටයුතු ඇරඹීමට ප්‍රමාණවත් හේතු ඇති බවට විනය පරීක්ෂණ සභාව සෑහීමකට පත්වේ නම්, එකී සාමාජිකයාට එරෙහිව චෝදනා පත්‍රයක් සකස් කළ යුතුය.

07.5.1. එකී චෝදනා පත්‍රය ලියාපදිංචි තැපෑලෙන් චූදිත සාමාජිකයාට යැවිය යුතුය.

07.5.2. එකී චෝදනා පත්‍රයේ දැක්වෙන දිනයේදීම එය තැපැල් කළ යුතුය.

07.5.3. එකී චෝදනා පත්‍රයේ දැක්වෙන දිනයට පසු දිනයක තැපැල් කළේ නම්, එකී දිනය චෝදනා පත්‍රයේ දිනය ලෙස සැලකේ.

07.5.4. එකී චෝදනා පිළිබඳව යම් නිදහසට කරුණු දැක්වීමක් කරන්නේ නම්, එය චෝදනා පත්‍රයේ දිනයේ සිට දින දා හතරක් (14) ඇතුළත විනය පරීක්ෂණය සභාවේ සභාපතිවරයාට ලිඛිතව එවිය යුතු බව දැන්විය යුතුය.

07.5.5. චෝදනා පත්‍රයට විනය පරීක්ෂණ සභාවේ සභාපති වරයා අත්සන් කළ යුතුය. ඔහු වෙනුවෙන් එකී සභාවේ සාමාජිකයෙකුට ද අත්සන් කළ හැක.

07.6. යම් චූදිත සාමාජිකයෙකු ලබා දෙන ලද කාල සීමාව තුළ නිදහසට කරුණු දැක්වීමක් නොකොළොත්, ඔහුට එකී චෝදනා පිළිබඳ නිදහසට කරුණු දැක්වීමට කාරණා නොමැති බව විනය පරීක්ෂණ සභාව නිගමනය කළ යුතුය.

07.7. විනය පරීක්ෂණ සභාව විසින් සිය අභිමතය පරිදි යම් චූදිත සාමාජිකයෙකුට නිදහසට කරුණු දැක්වීමට ලබාදුන් කාලය වරක් හෝ ඊට වැඩි වාරයක් දීර්ඝ කළ හැකි නමුත්, එසේ කරනු ලබන සියලුම දීර්ඝ කිරීම් දින දාහතරක් නොඉක්ම විය යුතුය.

07.8. නිදහසට කරුණු දැක්වීමට ලබාදුන් කාලය ඉක්ම යෑමෙන් පසු විනය පරීක්ෂණ සභාව විසින් සාමාජිකයාට එරෙහිව නගන ලද චෝදනා එකී චෝදනා සනාථ කිරීමට ලැබී තිබුණු සාක්ෂි, එකී චෝදනා සම්බන්ධයෙන් චූදිත සාමාජිකයා විසින් නිදහසට කාරණා

දක්වා ඇත්නම් එසේ දක්වන ලද නිදහසට කාරණා, එක් එක් චෝදනාවට වැරදිකරු ද, නිවැරදිකරු ද යන්න පිළිබඳ සභාවේ නිගමනය අඩංගු වාර්තාවක් හැකි ඉක්මනින් සකස් කර මධ්‍යම කාරක සභාවට යොමු කළ යුතුය.

07.8.1. චූදිත සාමාජිකයාට එරෙහිව රැස් කර ගන්නා ලද සියලුම සාක්ෂි ද චූදිත සාමාජිකයා විසින් එවන ලද නිදහසට කරුණු දැක්වීම ද එකී වාර්තාවට ඇමිණිය යුතුය.

07.8.2. එකී වාර්තාවට විනය පරීක්ෂණ සභාවේ සියලුම සාමාජිකයන් විසින් අත්සන් කළ යුතුය.

07.8.3. යම් සාමාජිකයෙකු විසින් බහුතර තීරණයට එකඟ නොවන්නේ නම්, ඒ බව වාර්තාවේ සඳහන් කරමින් ඔහු ද වාර්තාවට අත්සන් තැබිය යුතුය.

07.9. විනය පරීක්ෂණය පැවැත්වෙන අතරේදී විනය පරීක්ෂණ සභාවේ යම් පුරප්පාඩුවක් ඇති වුවහොත් විනය කමිටුවේ සභාපති විසින් විනය කමිටුවේ සාමාජිකයන් අතරින් එකී පුරප්පාඩුව පිරවිය යුතුය.

07.9.1. එකී පුරප්පාඩුව පුරවන තෙක් විනය පරීක්ෂණ සභාවේ කටයුතු අත්හිටුවිය යුතුය.

07.9.2. එකී පුරප්පාඩුව ඇති වී දින තුනක් ඇතුළත එය පිරවිය යුතුය.

07.9.3. පුරප්පාඩුව ඇති වන විට විනය පරීක්ෂණය පැවැත් වූ තැන සිට පුරප්පාඩු පිරවීමෙන් පසු නැවත කටයුතු ඇරඹිය යුතුය.

07.10. චූදිත සාමාජිකයා පිළිබඳ විනය පරීක්ෂණ වාර්තාව සලකා බැලෙන මධ්‍යම කාරක සභාව කැඳවන ලිපියේ එකී වාර්තාව සලකා බැලෙන බව දැනුම් දිය යුතු අතර එකී වාර්තාවේ පිටපතක් රැස්වීම පැවැත්වීමට අවම වශයෙන් පැය 48 ක ට පෙර සෑම මධ්‍යම කාරක සභිකයෙකුට ම ලබා දිය යුතුය.

07.11. මධ්‍යම කාරක සභාව විසින් විනය පරීක්ෂණ සභාවේ වාර්තාව සහ ඒ ආශ්‍රිත අනෙකුත් ලියකියවිලි අධ්‍යයනය කිරීමෙන් පසු;

07.11.1. චූදිත සාමාජිකයා සියලුම චෝදනාවන්ට නිවැරදිකරු යැයි විනය පරීක්ෂණ සභාව විසින් නිගමනය කර ඇත්නම් ඔහුව සියලු චෝදනාවලින් නිදහස් කළ යුතුය.

07.11.2. චූදිත සාමාජිකයා යම් චෝදනාවකට වැරදිකරු යැයි විනය පරීක්ෂණ සභාව නිගමනය කර ඇත්නම් එකී සාමාජිකයාව පක්ෂ සාමාජිකත්වයෙන් නෙරපීම ද ඇතුළුව මධ්‍යම කාරක සභාවට සුදුසු යැයි හැඟෙන දඬුවමක් බහුතර අනුමැතියෙන් පැණවිය යුතුය.

මැතිවරණ කොමිෂන් සභාව
29 SEP 2026
නීති අංශය
රාජගිරිය

07.11.3. චූදිත සාමාජිකයා විසින් තම වැරැද්ද පිළිගෙන එයට සමාව අයැද අනාගතයේ දී එවැනි වැරදි නොකරන බවට ලිඛිත පොරොන්දුවක් පක්ෂ ලේකම්ට ලබාදී එකේ ලියවිල්ල සභාගත කළේ නම් විනය පරීක්ෂණ සභාව විසින් යම් චෝදනාවකට වැරදිකරු යැයි නිගමනය කර තිබුණත්, ඔහුට දඬුවම් නොපැණ වීමට තීරණය කළ හැක. එකී තීරණය නොපැමිණි සාමාජිකයන් ද ඇතුළුව මධ්‍යම කාරක සභාවේ තුනෙන් දෙකක බහුතරයක් විසින් අනුමත කළ යුතුය.

07.12. විනය පරීක්ෂණ ක්‍රමවේදයඃ

07.12.1. යම් සාමාජිකයෙකු පක්ෂය අරභයා යම් වරදක් කර ඇති බව වෙනත් ඕනෑම සාමාජිකයෙකුට වැටහී ගිය හොත් එම කරුණ අරභයා විනය පරීක්ෂණයක් අරඹන ලෙස ලිඛිත පැමිණිල්ලක් එම සාමාජිකයා විසින් පක්ෂයේ ප්‍රධාන ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය.

07.12.2. පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයා එම කරුණ ඊළඟ දේශපාලන මණ්ඩලයට ඉදිරිපත් කොට එහි බහුතර කැමැත්ත මත ඊළඟ මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළ යුතු වේ.

07.12.3. මෙකී පැමිණිල්ල දේශපාලන මණ්ඩල සාමාජිකයෙකු පිළිබඳව නම්, ඔහු ඒ දේශපාලන මණ්ඩල තීරණයට සහභාගි නොවිය යුතුය.

07.12.4. මධ්‍යම කාරක සභා විසින් එහි බහුතර කැමැත්ත මත එම විනය කටයුත්ත විනය කමිටුවට යොමු කළ යුතුය.

07.12.5. මෙකී පැමිණිල්ල මධ්‍යම කාරක සභිකයකු පිළිබඳව නම් ඒ තැනැත්තා එම මධ්‍යම කාරක සභා තීරණයට සහභාගි නොවිය යුතුය.

07.12.6. විනය කමිටුව තමන් වෙත ලැබුණු එවන් චෝදනා සම්බන්ධයෙන් අධ්‍යයනය කොට චෝදනා පත්‍රයක් පිළියෙල කළ යුතුය.

07.12.7. චූදිත සාමාජිකයාට එරෙහිව ඇති චෝදනා විභාග කිරීමට විනය කමිටුවට යොමු කළ බවත් තමන් විසින් ඉදිරියේදී එහි කටයුතු පිළිබඳව දැනුම් දෙන බවත් පක්ෂයේ ප්‍රධාන ලේකම් විසින් චූදිත සාමාජිකයාට දන්වමින් ලියාපදිංචි තැපැලෙන් ලිපියක් යැවිය යුතුය.

07.12.8. එකී චෝදනාවන්ට නිදහසට කරුණු ඇත්නම් එම කරුණු සති දෙකක් ඇතුළත ලියාපදිංචි තැපැලෙන් එකී මණ්ඩලයේ ලේකම්ට එවන මෙන් චූදිත සාමාජිකයාට දැනුම් දිය යුතුය.

07.13. ඉහත 07.12.7. හි දැක්වෙන ලිපිය චූදිත සාමාජිකයාට යැවූ බවට එකී ලිපියේ සහ ලියාපදිංචි තැපැල් කුවිතාන්සියේ පිටපත් පක්ෂයේ ප්‍රධාන ලේකම් විසින් විනය කමිටුවේ

සාමාජිකයන් වෙත ඉදිරිපත් කර, කමිටුවේ සාමාජිකයන් සමග සාකච්ඡා කර විනය පරීක්ෂණය පැවැත්වීමට, ස්ථානයක්, දිනයක් සහ වේලාවක් නියම කළ යුතුය.

07.14. එකී දිනයේ එකී වෙලාවට එකී ස්ථානයේ විනය පරීක්ෂණය ඇරඹෙන බවට ලියාපදිංචි තැපෑලෙන් පක්ෂයේ ප්‍රධාන ලේකම් විසින් චූදිත සාමාජිකයාට දැනුම් දිය යුතුය.

07.14.1. විනය පරීක්ෂණය අරඹන දිනය හා දැනුම්දීමේ ලිපි තැපැල් කරන දිනය අතර අවම වශයෙන් දින දාහතරක (14) පරතරයක් තිබිය යුතුය.

07.14.2. අදාල සාක්ෂිකරුවන්ට දැනුම්දීම කළ යුත්තේ පක්ෂයේ ප්‍රධාන ලේකම්වරයාය.

07.15. විනය පරීක්ෂණ පැවැත්වීමට අවශ්‍ය අරමුදල් පක්ෂයේ භාණ්ඩාගාරික විසින් එකී විනය කමිටුවේ ලේකම්ට නොපමාව ලබා දිය යුතුය.

07.16. විනය පරීක්ෂණයේ දෛනික කටයුතු පිළිබඳව වාර්තාවක් තබා ගැනීම විනය මණ්ඩලයේ ලේකම්වරයාගේ වගකීම වන්නේය.

07.17. ස්වාභාවික යුක්තියේ මූලධර්මවලට අනුකූල ව විනය පරීක්ෂණය පවත්වන ආකාරය තීරණය කිරීමට විනය කමිටුව විසින් පත් කරනු ලබන තිදෙනෙකුට නොඅඩු ස්වාධීන විනය පරීක්ෂණ මණ්ඩලයට බලය තිබේ.

07.18. විනය පරීක්ෂණය අවසන් කිරීමෙන් පසුව එහි නිගමන දැක්වෙන වාර්තාවක් ස්වාධීන විනය පරීක්ෂණ මණ්ඩලය විසින් පක්ෂයේ ප්‍රධාන ලේකම් මගින් මධ්‍යම කාරක සභාවට යොමු කළ යුතුය.

07.19. වාචික සාක්ෂි මෙහෙයවීම ඇතුළු විනය පරීක්ෂණයේ දෛනික වාර්තා පැමිණිල්ල වගඋත්තරකරු සහ ප්‍රධාන ලේකම් විසින් පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කර ලේඛන යනාදිය වාර්තාවේ උපලේඛණ ලෙස එක් කළ යුතුය.

07.20. යම් සාමාජිකයෙකු විසින් විනය කඩ කිරීමක් පිළිබඳව විමර්ශනය කරන මෙන් විනය කමිටුවේ සභාපතිට මධ්‍යම කාරක සභාව විසින් දැනුම් දීමෙන් පසු එකී සාමාජිකයා පිළිබඳ විනය පරීක්ෂණය අවසන් වන තෙක් කාල පරාසය තුළ නිදහසට කරුණු විමසීමකින් තොරව එකී සාමාජිකයාගේ පක්ෂ සාමාජිකත්වය අත්හිටුවීමට මධ්‍යම කාරක සභාවට හැකිය.

07.21. පක්ෂ සාමාජිකයෙක් විසින් විනය කඩ කිරීම පිළිබඳව මධ්‍යම කාරක සභාව බහුතරය විසින් ගන්නා ඕනෑම විධිමත් තීරණයක් අවසාන තීරණය වේ.

<u>පස්වන පරිච්ඡේදය</u>

**08.** ජාතික මහා සම්මේලනය:

08.1. එක් එක් දිසා සභාවේ හා ආසන සභාවේ සාමාජිකත්වය ශක්තිය සැලකිල්ලට ගෙන මධ්‍යම කාරක සභාව විසින් නිශ්චය කරනු ලබන එකී සභාවල සාමාජිකයන් හා වෙනත් සාමාජිකයන් යම් සංඛ්‍යාවක් ජාතික සම්මේලනයට සහභාගි විය යුත්තේය. ජාතික මහා සම්මේලනය සනපූර්ණය මධ්‍යම කාරක සභාව හා නිශ්චය කරනු ලබන ආරාධිත සාමාජික සංඛ්‍යාවෙන් 25% කට නොඅඩු පිරිසකගෙන් සමන්විත විය යුත්තේය.

08.2. එකී සම්මේලනය වාර්ෂිකව පැවැත්විය යුතුය.

08.3. පක්ෂ ව්‍යවස්ථා සංශෝධනය හා නව නිලධාරි මණ්ඩලය පිළිබඳව මධ්‍යම කාරක සභාව විසින් ගනු ලබන තීරණ වාර්ෂික ජාතික මහා සම්මේලනයේදී අනුමත කළ යුතුය.

08.4. පක්ෂ ප්‍රධාන ලේකම්වරයා විසින් අවසන් වරට පැවැත්වූ ජාතික මහා සම්මේලනය පසුවූ ගෙවනු කාලය පිළිබඳ වාර්ෂික ප්‍රගති වාර්තාවක් ඉදිරිපත් කළ යුතුය.

08.5. ජාතික මහා සම්මේලනයට ඉදිරිපත් කළ යෝජනාවක් ජාතික මහා සම්මේලනයේදී ඒකමතිකව සම්මත නොවුනහොත් ඒ සම්බන්ධයෙන් සම්මේලනයට සහභාගි වන සාමාජිකයන්ගේ ඡන්ද විමසීමක් පැවැත්විය යුතුය. එකී ඡන්ද විමසීම පැවැත්විය යුත්තේ පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ අධීක්ෂණය යටතේය.

08.6. යම් වර්ෂයක දී පක්ෂයේ සම්මේලනයක් පැවැත්වීමට අපොහොසත්වීම නිසා, මේ ව්‍යවස්ථාවේ යම් විධිවිධානයක් ප්‍රකාරව පක්ෂය ඕනෑම නිලධාරියකු, කමිටුවක් හෝ අනුකමිටුවක් යථා පරිදි සිදු කරන ලද යම් ක්‍රියාවක් නිර්බල නොවන්නේය.

08.7. පක්ෂ සම්මේලනයේදී පක්ෂයේ ප්‍රධාන නිලධාරී මණ්ඩලය, මධ්‍යම කාරක සභාව යන ආයතනයන්හි සාමාජිකයන්, බහුතර ඡන්දයෙන් පත් කරගත යුතුය.

08.8. යම් වර්ෂයක දී පක්ෂයේ සම්මේලනයක් පැවැත්වීමට අපොහොසත්වීම නිසා, 08.6, 08.7 හි සඳහන් ආයතනයන්ට නිලධාරීන් පත් කර ගැනීමට නොහැකි වුවහොත් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ බහුතර ඡන්දයෙන් පවතින නිලධාරි මණ්ඩලයේ ධූර කාලය නැවත පක්ෂ සම්මේලනයක් පවත්වන දින දක්වා දීර්ඝ කළ හැක.

08.9. ජාතික මහා සම්මේලනය බලතල ප්‍රකාරව පක්ෂයේ ව්‍යවස්ථාව සහ ස්ථාවර නියෝග සඳහා අලුතෙන් කොටස් එක් කිරීමෙන් හෝ කොටස් ඉවත් කිරීමෙන් හෝ ආදේශනය කිරීම මගින් සංශෝධනය කිරීමට ජාතික මහා සම්මේලනයට බලය ඇත.

## 09. ජාතික මහා සම්මේලනයේ ක්‍රියාපටිපාටියඃ

09.1. ජාතික මහා සම්මේලනයේ ක්‍රියාපටිපාටිය පක්ෂය ස්ථාවර නියෝගවලට වෙසෙසින්ම අනුගත විය යුතුය.

09.2. පක්ෂයේ වාර්ෂික ප්‍රගති වාර්තාව සභාගත කිරීම

09.3. පක්ෂයේ වාර්ෂික මූල්‍ය වාර්තාව සභාගත කිරීම.

09.4. මෙහි 08.7. ප්‍රකාර පක්ෂය නිළධාරීන් පත්කර ගැනීම ව්‍යතිරේක තත්ත්වයක් යටතේ ජාතික මහා සම්මේලනයේ යෝජනා සම්මතයකින් අනතුරුව පක්ෂයේ නායක, සභාපති, ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික තනතුරු හැර සෙසු තනතුරු සඳහා නිලධාරීන් පත්කිරීමේ බලය අදාල වර්ෂයේ දී තෝරා පත් කර ගනු ලබන මධ්‍යම කාරක සභාවට ලබාදිය හැකි අතර එසේ පත් කරනු ලබන නිලධාරීන්ගේ පත් කිරීම් සඳහා අපරානුමතිය එම වර්ෂයට අනතුරුව පැවැත්වෙන ජාතික මහා සම්මේලනයේදී ලබා ගත යුතුව තිබේ.

09.5. මෙහි 08.7. ප්‍රකාර පක්ෂයේ දේශපාලන මණ්ඩලයේ සාමාජිකයන් ජාතික මහ සමුළුවෙන් අනතුරුව පවත්නා පළමු මධ්‍යම කාරක සභාවේ දී පත්කර ගත යුතුය. මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින් නාමයෝජනා කරගැනීම සහ පත්කර ගැනීම ව්‍යතිරේක තත්වයක් යටතේ ජාතික මහා සම්මේලනයේ යෝජනා සම්මතයකින් අනතුරුව මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන් අතරින් සියයට 40 ක සාමාජික එකගතාවයකින් පත්කර ගැනීමේ බලය ජාතික මහා සම්මේලනය විසින් පත් කරනු ලබන අභිනව මධ්‍යම කාරක සභාවට ලබාදිය හැකි අතර එසේ පත් කරනු ලබන මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන් සඳහා අපරානුමතිය ඒ ඒ වර්ෂයන්ට අනතුරුව පැවැත්වෙන ජාතික මහා සම්මේලනයෙන් ලබා ගත යුතුව තිබේ.

09.6. ඉදිරි වර්ෂය සඳහා විගණන ආයතනයක් හෝ ස්වාධීන ගනන් පරීක්ෂණ ආයතනයක් ජාතික මහා සමුළුවෙන් පසු පැවැත්වෙන ප්‍රථම මධ්‍යම කාරක සභාව විසින් ගිණුම් පරීක්ෂාව සඳහා පත්කර ගත යුතුය.

09.7. ව්‍යවස්ථාව සංශෝධනය සඳහා ඇති යෝජනා සැළකිල්ලට ගැනීම සහ වෙනස්කම් කිරීම සඳහා ඡන්ද විමසීම ව්‍යවස්ථා ප්‍රතිපාදන අනුව සිදුකළ යුතුය.

09.8. නියි පූර්ව දැනුම්දීමක් කර ඇති අනෙකුත් ඕනෑම යෝජනාවක් සලකා බැලීම.

## 10. විශේෂ සමුළු

පක්ෂයේ සභාපති විසින් සිය අභිමතය පරිදි පක්ෂයේ ප්‍රධාන ලේකම් වෙත යොමු කරන ලද පක්ෂයේ ඡන්ද බලය හිමි සාමාජිකයන්ගෙන් 25% ක ට නොඅඩු පිරිසකගේ අත්සනින් යුතුව

නිවැරදි කරුණු දැක්වීමකින් යුතුව කරන ලද ඉල්ලීමක් අනුව දින 21ක කාලයක් ඇතුළත විශේෂ සමුළුවක් කැඳවිය විය හැකිය. මෙම සමුළුවේදී අදාල ඉල්ලීම් සඳහා සුවිශේෂී කරුණු සම්බන්ධයෙන් පමණක් ම විශේෂයෙන් සාකච්ඡාව කළ යුතු වන්නේ ය.

විශේෂ සමුළුවක් සඳහා වන යෝජනාව මධ්‍යම කාරක සභාවේ සාකච්ඡාවට අනුමැතියට ලක් විය යුතු අතර එකී විශේෂ සමුළුව සඳහා වන නිවේදනය හා යෝජනා වෙතොත් එම යෝජනා පක්ෂයේ ප්‍රධාන ලේකම් හරහා සාමාජිකත්වය වෙත දැනුම් දීම සිදු කළ යුතුව තිබේ.

<u>හයවන පරිච්ඡේදය</u>

## 11. පක්ෂ සංවිධාන ව්‍යුහය:

පක්ෂය පහත සඳහන් මණ්ඩල හා ප්‍රාදේශීය සංවිධානවලින් සමන්විත වේ.

11.1. මධ්‍ය මණ්ඩල

11.1.1. දේශපාලන මණ්ඩලය

11.1.2. මධ්‍යම කාරක සභාව

11.1.3. ජාතික මහා සම්මේලනය

11.1.4. භාරකාර මණ්ඩලය

11.1.5. මධ්‍යම කාරක සභාව නම් කරන ජාතික මණ්ඩල කමිටුව

11.1.6. මධ්‍යම කාරක සභාව නම් කරන අධික්ෂණ කමිටුව

11.1.7. මධ්‍යම කාරක සභාව නම් කරන අනු කමිටු

11.1.8. මධ්‍යම කාරක සභාව නම් කරන විනය කමිටුව

11.2. ප්‍රාදේශීය සංවිධාන

ප්‍රාදේශීය සංවිධානවල ව්‍යුවහය මධ්‍යම කාරක සභාව විසින් අනුමත කළ යුතුය. ප්‍රාදේශීය සංවිධානය මෙසේ වෙයි.

11.2.1. දිස්ත්‍රික් සභාව

11.2.2. ආසන සභාව

11.2.3. ප්‍රාදේශීය සභාව

11.2.4. කොට්ඨාස සභාව

11.2.5. ආයතන, විෂයානුබද්ධ හෝ වෘත්තික සභා

## 12. පක්ෂයේ නිලධාරීන්

පක්ෂ නායක, පක්ෂ සභාපති, පක්ෂ ප්‍රධාන ලේකම්, ජාතික සංවිධායක, භාණ්ඩාගාරික, ජ්‍යේෂ්ඨ උප සභාපතිවරු 03 දෙනා, උප සභාපතිවරු 05 දෙනා, නියෝජ්‍ය ලේකම්වරු 11 දෙනා යන අය පක්ෂයේ ප්‍රධාන නිලධාරීන් වේ. පක්ෂයේ යම් නිලධාරියෙක් ඔහු හෝ ඇයගේ වගකීම් සහ ක්‍රියාකාරකම් නිසි පරිදි ඉටුකිරීමට නොහැකි පරිදි අකර්මණ්‍ය වී ඇතැයි දේශපාලන මණ්ඩලය විසින් තීරණය කළහොත්, අදාළ තැනැත්තා නැවතත් රාජකාරි කිරීමට සුදුසු යැයි දේශපාලන මණ්ඩලය තීරණය කරන තුරු, ඔහු හෝ ඇයගේ රාජකාරී ආවරණය කිරීම සඳහා සුදුසු පුද්ගලයකු මීළඟ මහ සභාව තෙක් පත්කිරීමට දේශපාලන මණ්ඩලයට හැකිය. එසේ පත් කරනු ලබන තැනැත්තා අදාළ නිලයේ සියලු වගකීම් සහ රාජකාරී ඉටු කිරීම සඳහා නිල වශයෙන් සුදුසුවේ.

12.1. පක්ෂ නායක

12.1.1. පක්ෂයේ ප්‍රධානියා පක්ෂ නායකයා ය.

12.1.2. දේශපාලන මණ්ඩලයේ සභාපති ධූරය පක්ෂ නායකයාට නිල බලයෙන් හිමිවේ.

12.2. සභාපති

12.2.1. අනෙකුත් සියලු සභාවල මුලසුන දැරීම සභාපති විසින් සිදුකරන අතර සභාපති නොමැති අවස්ථාවක දේශපාලන මණ්ඩලයේ සාමාජිකයෙකුට එහි මුලසුන දැරීමට අයිතිය තිබේ.

12.3. ~~මහලේකම්~~ ( ප්‍රධාන ලේකම් )

පක්ෂයේ ප්‍රධාන ලේකම්ට අයිති කාර්යයන් මෙසේය:

12.3.1. මැතිවරණ කොමිසම් සභාව හා ආශ්‍රිත ආයතන සමඟ පක්ෂය සම්බන්ධතාවය පවත්වා ගැනීම.

12. පක්ෂයේ නිලධාරීන්

පක්ෂ නායක, පක්ෂ සභාපති, පක්ෂ ප්‍රධාන ලේකම්, ජාතික සංවිධායක, භාණ්ඩාගාරික, ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරු 03 දෙනා, උප සභාපතිවරු 05 දෙනා, නියෝජ්‍ය ලේකම්වරු 11 දෙනා යන අය පක්ෂයේ ප්‍රධාන නිලධාරීන් වේ. පක්ෂයේ යම් නිලධාරියෙක් ඔහු හෝ ඇයගේ වගකීම් සහ ක්‍රියාකාරකම් නිසි පරිදි ඉටුකිරීමට නොහැකි පරිදි අකර්මණ්‍ය වී ඇතැයි දේශපාලන මණ්ඩලය විසින් තීරණය කළහොත්, අදාළ තැනැත්තා නැවතත් රාජකාරි කිරීමට සුදුසු යැයි දේශපාලන මණ්ඩලය තීරණය කරන තුරු, ඔහු හෝ ඇයගේ රාජකාරි ආවරණය කිරීම සඳහා සුදුසු පුද්ගලයකු මීළඟ මහ සභාව තෙක් පත්කිරීමට දේශපාලන මණ්ඩලයට හැකිය. එසේ පත් කරනු ලබන තැනැත්තා අදාළ නිලයේ සියලු වගකීම් සහ රාජකාරි ඉටු කිරීම සඳහා නිල වශයෙන් සුදුසුවේ යනුවෙන් සංශෝධනය කර ඇත.

---

12.3.2. දේශපාලන මණ්ඩලය හා මධ්‍යම කාරක සභාව කැඳවීම සහ අදාල වාර්තා පවත්වාගෙන යාම.

12.3.3. පක්ෂයට අයත් සියලුම වැදගත් ලිපි සුරක්ෂිතව පවත්වාගෙන යාම.

12.3.4. පක්ෂයේ වාර්ෂික ප්‍රගති වාර්තාව පක්ෂ සම්මේලනයට ඉදිරිපත් කිරීම.

12.3.5. අනෙකුත් බාහිර ආයතන සංවිධාන හා පුද්ගලයින් සමග පක්ෂය වෙනුවෙන් මධ්‍යම කාරක සභාවේ අණ පරිදි ලිපි ගනුදෙනු කිරීම.

12.3.6. පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ තීන්දු මත ජාතික මහා සම්මේලනය කැඳවීම.

12.3.7. පක්ෂ මූලස්ථානයේ පරිපාලන කටයුතු පවත්වාගෙන යාම.

12.3.8. පක්ෂයේ සංවිධාන ව්‍යුවහයන්හී මනා ක්‍රියාකාරීත්වයට අවශ්‍ය පසුබිම සැකසීම, ක්‍රියාකාරකම් අධීක්ෂණය කිරීම හා මෙහෙයවීම.

12.3.9. මධ්‍යම කාරක සභාවේ තීරණ අනුව පක්ෂ නියෝජනය, උප ලේකම්වරුන්ට විවිධ විෂයන්ට අදාලව බෙදා දීම හා ඒවා අධීක්ෂණය.

12.3.10. මධ්‍යම කාරක සභාවේ තීරණ අනුව අනෙකුත් දේශපාලන පක්ෂ සමග පක්ෂය සබඳතා පවත්වාගෙන යාම හා ඒ පිළිබඳව මධ්‍යම කාරක සභාව දැනුවත් කිරීම.

12.3.11. විනය කඩ කිරීම පිළිබඳ චූදිත සාමාජිකයෙකු වැරදි පිළිගෙන කරනු ලබන ලිඛිත පොරොන්දු භාර ගැනීම හා ඒවා මධ්‍යම කාරක සභාවේ දී සභාගත කිරීම.

12.3.12. මධ්‍යම කාරක සභාවේ නියමය පරිදි ජාතික මහා සම්මේලනය හෝ විශේෂ සම්මේලනය පැවැත්වීම පිළිබඳ නිවේදනයන් ද මධ්‍යම කාරක සභාව අනුමත කරනු ලබන ජාතික මහ සම්මේලනයට හෝ විශේෂ සම්මේලනයක් සඳහා ඉදිරිපත් කරනු

ලබන නාම යෝජනා පක්ෂ සාමාජිකත්වය වෙත සිය අත්සන හා මුද්‍රාව යටතේ දැනුම් දීම.

12.4. ජාතික සංවිධායක

12.4.1. පක්ෂයේ සංවිධාන සහ මැතිවරණ කටයුතු සම්බන්ධ සියළු ක්‍රියාවන්හි නියුතු වීම උදෙසා පත්කෙරන ජාතික මණ්ඩලයේ සභාපති තනතුරු දැරීම.

12.4.2. දිස්ත්‍රික් සංවිධානයන්හි කටයුතු අධීක්ෂණය, ඒවායෙහි ක්‍රියාකාරීත්වය පිළිබඳව වගකීම දැරීම.

12.4.3. දිස්ත්‍රික් සභා, ආසන සභාව හා ශාඛා සංවිධාන පිහිටුවමින් පක්ෂ ජාලය ව්‍යාප්ත කිරීම.

12.4.4. මැතිවරණ හා පක්ෂ සංවිධාන කටයුතු භාරව ක්‍රියාකිරීම.

12.4.5. පක්ෂයේ අනුබද්ධ ආයතන, විෂය හෝ වෘත්තික සභා හා සංවිධාන පිහිටුවීම හා ඒවායෙහි ක්‍රියාකාරීත්වය අධීක්ෂණය කිරීම.

12.4.6. මැතිවරණ අපේක්ෂකයින් තීරණය කිරීම සඳහා පත්කරන නාමයෝජනා කමිටුවේ සහ ආසන සංවිධායකයින් පත්කිරීමේ කමිටුවේ ලේකම් ධූරය දැරීම.

13. දේශපාලන මණ්ඩලය

13.1. පක්ෂයේ මූලික තීරණ ගැනීමේ සභාව, දේශපාලන මණ්ඩලය වේ.

13.2. දේශපාලන මණ්ඩලයේ සාමාජිකයන් පත් කිරීම ජාතික සම්මේලනය පැවැත්වීමෙන් අනතුරුව පැවැත්වෙන ප්‍රථම මධ්‍යම කාරක සභාවේදී සිදුකළ යුතුය. පක්ෂ නායක, පක්ෂ සභාපති, පක්ෂ ප්‍රධාන ලේකම්, ජාතික සංවිධායක, නිල බලයෙන් මෙහි ධූරධාරීන් වේ. පක්ෂ නායක හෝ ඔහුගේ පූර්ණ අනුමැතිය සහිතව දේශපාලන මණ්ඩලයේ බහුතර ඡන්දයෙන් පත්කර ගනු ලබන සාමාජිකයෙක් මෙහි සභාපති වේ. පක්ෂ ප්‍රධාන ලේකම් මෙහි ලේකම් වේ. මෙහි ධූර කාලය අනුයාත ජාතික සම්මේලන දෙකක් අතර කාල වකවානුව වේ.

13.3. පහත සඳහන් අවස්ථා වලදී දේශපාලන මණ්ඩලයේ සාමාජිකත්වය හෝ ධූර පුරප්පාඩු වේ.

13.3.1. ඉල්ලා අස්වීමේ ලිපිය ප්‍රධාන ලේකම් වෙත භාරදීමෙන්

13.3.2. ධූර කාලය අවසන් වීමෙන්.

13.3.3. සාමාජිකයෙකු මියයාමෙන්

13.3.4. නිසි පරිදි අවසර නොගෙන අනුයාත රැස්වීම් තුනකට නොපැමිණීම් හේතුවෙන් දේශපාලන මණ්ඩලයේ සාමාජිකත්වයෙන් නෙරපීමෙන්.

13.3.5. නිදහසට කරුණු විමසීමෙන් සහ විනය ක්‍රියාමාර්ගයකින් පසුව ධූරයෙන් ඉවත් කිරීම සුදුසු බව මධ්‍යම කාරක සභාවේ තුනෙන් දෙකක බහුතර ඡන්දයෙන් සම්මත වීමෙන්.

13.4. ධූරයක් හෝ දේශපාලන මණ්ඩල සාමාජිකත්වයක් පුරප්පාඩු වූ විට එය මධ්‍යම කාරක සභාවේ රැස්වීමකදී දින 30ක් ඇතුළත පිරවිය යුතුය.

13.5. රැස්වීමං:

13.5.1. දේශපාලන මණ්ඩලයේ රැස්වීම් අවම වශයෙන් මසකට දෙවතාවක් කැඳවිය යුතු වේ.

13.5.2. පක්ෂ නායකයාගේ නියමය අනුව හෝ අවම වශයෙන් දේශපාලන මණ්ඩලයේ රැස්වීම් සාමාජිකයන් තුන්දෙනෙකුගේ ලිඛිතව කරන ඉල්ලීමක් අනුව හෝ විශේෂ රැස්වීමක් කැඳවිය හැකිය.

13.5.3. රැස්වීම් පටිපාටිය හා රීති දේශපාලන මණ්ඩලය විසින් සකස් කර අනුමත කර ගත යුතුය.

13.6. බලතලං:

13.6.1. පක්ෂයේ දර්ශනය හා ප්‍රතිපත්ති පිළිබඳ ජනතාව දැනුවත් කිරීමට අවශ්‍ය උපදෙස් පක්ෂයේ විවිධ මණ්ඩලවලට ලබාදීම.

13.6.2. පක්ෂ සාමාජිකයන්ගේ හා මහජන නියෝජිතයන්ගේ විනය හා ආචාර ධර්ම පිළිබඳව කාර්ය සංග්‍රහයක් පිළියෙළ කොට අනුමත කිරීම.

13.6.3. පක්ෂයේ අනු මණ්ඩල වලින් මධ්‍යම කාරක සභාවට එන යෝජනා හා සමාජ ආර්ථික සංවර්ධන සැලසුම්, ප්‍රතිපත්ති අධීක්ෂණය හා විමර්ශනය, ඒ පිළිබඳවූ අදාල මණ්ඩලවලට මාර්ගෝපදේශනය ලබාදීම.

## 14. මධ්‍යම කාරක සභාව

### 14.1. සංයුතිය හා පත්වීම:

මධ්‍යම කාරක සභාවේ සාමාජික සංඛ්‍යාව අවම 60 ද උපරිමය 90ක් ද වේ. මෙ සාමාජිකයන් පක්ෂයේ වාර්ෂික සමුළුවේදී සහ ව්‍යවස්ථාවේ අදාළ වගන්තීන්ට යටත්ව පත් කරනු ලැබේ. මධ්‍යම කාරක සභාව පහත නිලධාරීන්ගෙන් සමන්විත වේ.

---

14.1. සංයුතිය හා පත්වීම:

"මධ්‍යම කාරක සභාවේ සාමාජික සංඛ්‍යාව අවම 60 ද උපරිමය 90ක් ද වේ" වගන්තිය වෙනුවට මධ්‍යමකාරක සභාවේ සාමාජිකයින් සංඛ්‍යාව උපරිමය 90 දෙනෙකු වේ යනුවෙන් සංශෝධනය කර ඇත.

---

14.1.1. පක්ෂයේ ප්‍රධාන නිලධාරීන් 24 දෙනා.

14.1.2. දේශපාලන මණ්ඩලය විසින් නම් කරනු ලබන මුළු සංයුතියෙන් තුනෙන් එකකට නොඅඩු අඩකට නොවැඩි සාමාජිකයින් පිරිසක්.

14.1.3. දිස්ත්‍රික් පදනමින් මධ්‍යම කාරක සභාව නියෝජනය කරන සෙසු සාමාජිකයන්. (සාමාජික හා ඡන්දදායක අනුපාතයේ පිළිබඳ විධිමත් අධ්‍යයනයකින් පසුව ඒ පිළිබඳව නිර්ණායක දේශපාලන මණ්ඩලය විසින් යෝජනා කිරීමෙන් අනතුරුව මධ්‍යම කාරක සභාව විසින් ප්‍රකාශයට පත් කරනු ලබන නිර්ණායක මත දිස්ත්‍රික්ක නියෝජිතයින් තෝරා පත් කරගනු ලබනවා ඇත).

### 14.2. රැස්වීම්:

14.2.1. මධ්‍යම කාරක සභාව මසකට වරක් රැස්විය යුතුය. පක්ෂ නායක, සභාපති හෝ අවම වශයෙන් සාමාජිකයන් දහතුන් දෙනෙකු හෝ කරන ලද ලිඛිත ඉල්ලීමකින් හෝ දේශපාලන මණ්ඩලයේ සම්මත වන යෝජනාවකින් හෝ විශේෂ රැස්වීමක් කැඳවිය හැක. කැඳවීම හා කාර්ය පටිපාටි මධ්‍යම කාරක සභාව විසින් සකස් කර අනුමත කළ යුතුය.

14.2.2. ඉහත 14.2.1. හි දැක්වෙන අයුරින් මධ්‍යම කාරක සභා රැස්වීමක් කැඳවිය යුතු යැයි ඉල්ලා සිටින විට, එකී ඉල්ලීම හෝ දැනුම් දීම කර දින හතක් ඇතුළත මධ්‍යම කාරක සභාව කැඳවිය යුතුය.

14.3. බලතලඃ

14.3.1. පක්ෂයේ සාමාජිකත්වය පිළිබඳ නීති-රීති පැනවීම හා සාමාජිකත්වය වර්ධනය කිරීම.

14.3.2. පක්ෂයේ ප්‍රධාන නිලධාරීන් හා මධ්‍යම කාරක සභිකයන් තෝරාගෙන ඔවුන්ගේ නම් බහුතර අනුමැතිය සඳහා පක්ෂ සම්මේලනයට නිර්දේශ කිරීම.

14.3.3. පක්ෂයේ දේශපාලන මණ්ඩල පත්කිරීම හා පුරප්පාඩු පිරවීම.

14.3.4. පක්ෂය වෙනුවෙන් නඩු පැවරීම.

14.3.5. සාමාජික ලේඛන යාවත්කාලීන කිරීම. ඒවායේ නිරවද්‍යතාවය සහතික කිරීම.

14.3.6. පක්ෂය සතු දේපල හා මුදල් භාරව සිටීම හා ඒවා භාරකාර මණ්ඩලය ඔස්සේ ව්‍යවස්ථානුකූලව පාලනය කිරීම.

14.3.7. අරමුදල් සංවර්ධනය කිරීම, සුරක්ෂිත කිරීම හා නිසි ලෙස උපයෝගී කර ගැනීමට සැලැස්වීම සහ වාර්ෂික අයවැය ලේඛනය භාණ්ඩාගාරික ලවා පිළියෙල කිරීම. අනුමත කිරීම

14.3.8. පක්ෂයේ ප්‍රගති වාර්තාව සහ දේශපාලන යෝජනාව (ප්‍රතිපත්තිමය යෝජනා) පිළියෙල කිරීම හා එය ජාතික මහ සම්මේලනයට ඉදිරිපත් කිරීම.

14.3.9. විවිධ පාර්ශව සමග සම්මුති හා ගිවිසුම් ඇති කර ගැනීම.

14.3.10. දෛනික දේශපාලන කටයුතුවලට අදාළ ක්‍රියාමාර්ග අප්‍රතිහතව ක්‍රියාවට නැංවීම.

14.3.11. පක්ෂ ප්‍රතිපත්තිවලට අනුකූලව ඉදිරි ක්‍රියාමාර්ග සැලසුම් කිරීම මෙහෙයවීම සංවිධානය හා පාලනය කිරීම.

14.3.12. විනය කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම.

14.3.13. පක්ෂයේ ගිණුම් වාර්ෂිකව විගණනය කිරීම සඳහා විගණනවරයෙකු පත් කිරීම.

14.3.14. පක්ෂයට බැංකු ගිණුමක් විවෘත කර පවත්වාගෙන යාම.

14.3.15. පක්ෂය වෙනුවෙන් ණය ලබා ගැනීම.

14.3.16. පක්ෂය වෙනුවෙන් දේපළ අත්පත් කර ගැනීම සහ අන්සතු කිරීම.

14.3.17. ආසන හා භූගෝලීය කොට්ඨාස මට්ටමේ ජනතාව නියෝජිත ආයතන සඳහා සංවිධායකවරු පත් කිරීම හා ඒ සඳහා නාම යෝජනා කමිටුවක් පත් කිරීම.

14.3.18. මහජන නියෝජිත ආයතනයන්හි පක්ෂයේ නියෝජිතයන්ට දැරිය හැකි තනතුරු සඳහා පුද්ගලයින් නම් කිරීම.

14.3.19. පක්ෂයේ ආණ්ඩුවක් පිහිටුවන්නේ නම් ආණ්ඩුවකට සම්බන්ධ වන්නේ නම් එයට හිමිවන ඇමතිධූර, නියෝජ්‍ය ඇමති ධූර, ඇතුළු විවිධ තනතුරු සඳහා පුද්ගලයින් නම් කිරීම.

14.3.20. අවස්ථානුරූපීව සංවිධාන පහසුව සඳහා අනුකමිටු සඳහා සහකාර ලේකම්වරු පත්කිරීම සහ තාවකාලික කමිටු සහ අනු කමිටු පත් කිරීම.

14.3.21. පක්ෂයේ කමිටු, තාවකාලික කමිටු, අනු කමිටු හා ප්‍රාදේශීය සංවිධානවල ක්‍රියාකාරීත්වය කාර්යභාරය හා වගකීම් පිළිබඳව නීති රීති සැකසීම.

14.3.22. මධ්‍යම කාරක සභාවේ ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කිරීම ජාතික ඉලක්ක, වාර්ෂික ඉලක්ක අනුමත කිරීම හා පසුවිපරම් කිරීම.

14.3.23. යාවත්කාලීන කරන ලද සාමාජික ලේඛනවල නිරවද්‍යතාවය සහතික කර ලබා දීම.

14.3.24. ක්‍රියාකාරී සැලසුම් විශ්ලේෂණය කිරීම ජාතික ඉලක්ක හා වාර්ෂික ඉලක්ක අනුමත කිරීම ධූරාවලිය පහලට විමධ්‍යගත කිරීම හා පසුවිපරම් කිරීම.

14.3.25. පක්ෂයේ සාමාජිකත්වය ප්‍රවර්ධනය පිළිබඳව නිශ්චිත ඉලක්ක ලබාදීම ක්‍රියාමාර්ග නිර්ණය කිරීම, පසුවිපරම් කිරීම.

14.3.26. පක්ෂයේ නිලධාරීන්, කමිටු, අනු කමිටු වල බලතල නිර්ණය කිරීම හා ඉවත් කිරීම.

14.3.27. ජාතික මහා සම්මේලනය පැවැත්වීමට අදාළ නිවේදනය සහ නව යෝජනා පක්ෂ සාමාජිකත්වය වෙත පක්ෂ ප්‍රධාන ලේකම්වරයා හරහා ජාතික සම්මේලනය පැවැත්වීමට දින 21 ක ට පෙර දැනුම් දීම.

14.3.28. පක්ෂයේ ව්‍යවස්ථාවට අදාලව නව සංශෝධන ඇතොත් ජාතික මහා සම්මේලනයට පොරතුව ව පැවැත්වෙන මධ්‍යම කාරක සභාවේ, මහ සම්මේලනයේදී නව යෝජනාවක් ලෙස සම්මත කිරීම.

14.3.29. පක්ෂ නායක, සභාපති ඇතුළුව සහ සම්බන්ධීකරණයෙන් සාමාජිකයන් 20 ට නොවැඩි ඛිපි- පැවිදි උපදේශක සභාවක් පත් කිරීම හා අවශ්‍යතාවය පරිදි එම සභාවේ රැස්වීම් කැඳවීම.

15. අනු කමිටුඃ

පක්ෂයේ ප්‍රතිපත්ති සැලසුම් කිරීමටත්, අධ්‍යයනයටත්, පර්යේෂණ කිරීමටත්, සංවිධාන කටයුතු පහසුවටත් නම් කරන ලද විශේෂ ක්ෂේත්‍ර තුළ ක්‍රියාත්මක වීමටත්, මධ්‍යම කාරක සභිකයින් සහ මධ්‍යම කාරක සභිකයින් නොවන පක්ෂ සාමාජිකයන් ගෙන් යන දෙකොට්ඨාශයෙන්ම යුත් අනුකමිටු මධ්‍යම කාරක සභාව විසින් පත් කරනු ලැබේ.

15.1. අනුකමිටු කාර්යභාරයඃ

නම් කර ඇති අනුකමිටු පහත පරිදි වේ. මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතිව නව අනු කමිටු පිහිටුවීමට හෝ පවත්නා අනුකමිටු ඒකාබද්ධ කිරීමට හැකිවේ.

15.1.1. අභ්‍යන්තර පරිපාලන හා පුහුණු කටයුතු අනුකමිටුව.

15.1.2. සංස්කෘතික හා ආගමික කටයුතු අනුකමිටුව

15.1.3. තරුණ කටයුතු අනුකමිටුව

15.1.4. අරමුදල් ප්‍රවර්ධනය හා සාමාජික සුබසාධන කටයුතු අනුකමිටුව

15.1.5. නීති කටයුතු අනුකමිටුව

15.1.6. ජනමාධ්‍යය හා ප්‍රචාරක කටයුතු අනුකමිටුව.

15.1.7. වෘත්තික හා වෘත්තිය කටයුතු අනුකමිටුව.

15.1.8. කාන්තා කටයුතු අනුකමිටුව

15.1.9. ජාත්‍යාන්තර කටයුතු අනුකමිටුව

15.1.10. පක්ෂ සාමාජික ක්‍රියාකාරීත්ව අධීක්ෂණ අනුකමිටුව.

15.1.11. පර්යේෂණ හා සංවර්ධන කටයුතු අනුකමිටුව.

15.1.12 අධ්‍යාපන ක්ෂේත්‍ර කටයුතු අනුකමිටුව.

15.1.13 පළාත් පාලන හා මැතිවරණ කටයුතු අනුකමිටුව.

15.2. අනු කමිටුවේ සංයුතියඃ

15.2.1. පක්ෂයේ නම් කරන ලද නියෝජ්‍ය ලේකම්වරයෙක් මේ අනු කමිටු වල සභාපතිවේයි. මේ පත්වීම් සිදු කරනු ලබන්නේ මධ්‍යම කාරක සභාවෙනි. අවස්ථානුකූලව, නියෝජ්‍ය ලේකම්වරයාට සහාය වීම උදෙසා සහකාර ලේකම්වරයෙකු මධ්‍යම කාරක සභාව විසින් පත්කළ හැක.

15.2.2. පක්ෂ නායක, සභාපති, ජාතික සංවිධායක හා ප්‍රධාන ලේකම් නිල බලයෙන් මේ කමිටු වල සාමාජිකයන් වේ. මධ්‍යම කාරක සභිකයන් මෙන්ම මධ්‍යම කාරක සභිකයන් නොවන සුදුසු පක්ෂ සාමාජිකයන් මේවායේ අන් සාමාජිකයන් වේ.

15.2.3. දිවයිනේ සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන ලෙස ඒ ඒ දිස්ත්‍රික් කමිටු විසින් නම් කර එවන නියෝජිතයින් මෙහි සාමාජිකයන් ද වේ. මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතුව දිස්ත්‍රික් මට්ටමෙන් ද අනුකමිටු පවත්වා ගත හැකිය.

15.2.4. මේ අනු කමිටු වලට මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව විශේෂ ක්ෂේත්‍රයන් ට අදාළ සංවිධාන හෝ වෙනත් කමිටු පත් කළ හැක.

15.2.5. මෙම අනුකමිටු කැඳවීම ක්‍රියාත්මක කිරීම එහි සභාපති ධූරය දරන නියෝජ්‍ය ලේකම්වරයා ගේ වගකීම වේ.

15.2.6. මේ අනු කමිටුවල ක්‍රියාකාරිත්වය පිළිබඳව අධීක්ෂණ වාර්තා ප්‍රධාන ලේකම්වරයා විසින් විටින් විට මධ්‍යම කාරක සභාවට වාර්තා කළ යුතුය.

15.3. පුරප්පාඩු වීමඃ

පහත සඳහන් අවස්ථාවල අනුකමිටු සාමාජිකත්වය පුරප්පාඩු වේ.

15.3.1. ඉල්ලා අස්වීමේ ලිපිය එහි සභාපතිට (නියෝජ්‍ය ලේකම්ට) භාරදීමෙන්.

15.3.2. ධූර කාලය අවසන් වීමෙන්.

15.3.3. සාමාජිකයෙකුගේ මරණයෙන්.

15.3.4. නිසි පරිදි අවසර නොගෙන අනුයාත රැස්වීම් තුනකට නොපැමිණීම නිසා මධ්‍යම කාරක සභාවේ සම්මත වන යෝජනාවකින්.

15.3.5. විනයානුකූල ගැටළුවකට අනු මණ්ඩලයක් මගින් කරන ඉවත් කිරීමේ යෝජනාවක් විනය මණ්ඩලය විසින් පරීක්ෂා කිරීමෙන් පසුව විනය ක්‍රියාමාර්ග ගැනීම මගින්.

15.3.6. පක්ෂ සාමාජිකත්වය අහිමි වීමෙන් හෝ සාමාජිකත්වයෙන් ඉවත් කිරීමෙන්.

15.4. රැස්වීමං:

අනු කමිටු වල රැස්වීම් අවශ්‍යතාව අනුව පවත්වනු ඇත. අවම වශයෙන් මසකට වරක්වත් පැවැත්විය යුතුය.

15.5. අනු කමිටුවල වගකීම් හා බලතල:

15.5.1. අනු කමිටුවේ කාර්යභාරය වැඩසටහන් හා ප්‍රගතිය පිළිබඳව මධ්‍යම කාරක සභාවට හෝ දේශපාලන මණ්ඩලයට වාර්තා කිරීම.

15.5.2. දේශපාලන මණ්ඩලයේ නිර්දේශ අදාළ කමිටු විසින් ලබාගෙන ක්‍රියාත්මක කිරීම.

15.5.3. පක්ෂයේ දර්ශනයට හා ප්‍රතිපත්තිවලට අනුකූලව අනුකමිටුවේ වැඩසටහන් සම්පාදනය කිරීම. (වාර්ෂික සැලසුම් ඉදිරිපත් කිරීම.)

15.5.4. අනුකමිටුවේ කළමනාකරණ ක්‍රියාවලිය පවත්වා ගැනීම.

15.5.5. මධ්‍යම කාරක සභාවෙන් පැවරෙණ කටයුතු සිද්ධකිරීම.

15.5.6. මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළ යුතු වාර්තා සකස්කර අනුකමිටු සභාපතිවරයා මගින් භාරදීම.

16. ජාතික මණ්ඩලය.

පක්ෂයේ මැතිවරණ කටයුතු සම්බන්ධව සියලු ක්‍රියාවන්හි නියුතුවීම උදෙසා, ජාතික මණ්ඩලයක් ස්ථාපිත කළ හැකිය.

16.1. ජාතික මණ්ඩලයේ සංයුතිය:

16.1.1. පක්ෂ ජාතික සංවිධායක - නිල බලයෙන් ජාතික මණ්ඩලයේ සභාපති වේ. පක්ෂ නායක, ප්‍රධාන ලේකම් එහි සාමාජිකයන් වේ.

16.1.2. දිස්ත්‍රික් කළමණාකරුවන් (මොවුන් මැතිවරණ දේශපාලනයේ නියුතු නොවන්නන් විය යුතුය).

16.1.3. මැතිවරණ දේශපාලනයේ නියුතුවන ආසන, පළාත් පාලන ආයතන කොට්ඨාස මට්ටමේ ප්‍රධාන සංවිධායකවරුන්. අනුචිත පරිදි අදාල මැතිවරණ අපේක්ෂකයන්.

16.2. වගකීම් හා බලතලඃ

පහත සඳහන් කටයුතු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම.

16.2.1. මැතිවරණ අපේක්ෂක ලැයිස්තු පිලියෙල කිරීම.

16.2.2. මැතිවරණ සංවිධාන කටයුතු.

16.2.3. මැතිවරණ විනය කටයුතු.

16.2.4. මැතිවරණ ප්‍රචාරක කටයුතු.

16.2.5. සියලු මහජන නියෝජිත ආයතනවලට මැතිවරණයකට මුහුණ දීමට සූදානම් ආසන සංවිධායකවරුන් ඡන්ද කොට්ඨාස සංවිධායකවරුන් පත් කරගැනීම සඳහා නාමයෝජනා කමිටුවක් හඳුනාගෙන ඔවුන් පත් කිරීම සඳහා මධ්‍යම කාරක සභාවට යෝජනා කිරීම.

16.2.6. ආසන ප්‍රාදේශීය සභා, ඡන්ද මධ්‍යස්ථාන මට්ටමේ මැතිවරණ සංවිධාන ජාලය සැකසීම.

16.2.7. පත්කරන සංවිධායකවරුන්ගේ ප්‍රගතිය සමාලෝචනය කිරීම.

16.2.8. ප්‍රගතිය නොමැති සාමාජිකයන් පිළිබඳව පක්ෂ අධීක්ෂණ කමිටුවට වාර්තා කිරීම.

16.3. ජාතික මණ්ඩලය විසින් මහජන නියෝජිත මණ්ඩලයක් කැඳවිය හැක. එහි සංයුතිය පහත පරිදි විය යුතුය.

16.3.1. ජාතික සංවිධායක - නිලබලයෙන් මහජන නියෝජිත මණ්ඩලයේ සභාපති වේ, පක්ෂ නායක, සභාපති, ප්‍රධාන ලේකම් මෙහි අනිවාර්ය සාමාජිකයන් වේ.

16.3.2. පක්ෂයේ නියෝජනය කරන සියලුම මහජන නියෝජිතයන්ගෙන් මහජන නියෝජිත මණ්ඩලය සමන්විත වනු ඇත.

16.3.3. එකී මණ්ඩලය විසින් නම් කරන ලද සහකාර ලේකම්වරයෙකු විසින් එහි ලේඛන කටයුතු සිදුකල යුතුය.

16.3.4. පක්ෂය නියෝජනය කරන පාර්ලිමේන්තු කණ්ඩායමක් ඇත්නම් ඔවුනට පාර්ලිමේන්තු කටයුතු හා ඊට අදාළ දේශපාලන කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට මහජන නියෝජිත මණ්ඩලයේ අනුමණ්ඩල ලෙස වුවද වෙන්ව රැස්විය හැක.

16.3.5. මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතිව මහජන නියෝජිත මණ්ඩලයට පළාත් සභිකයින් හෝ පළාත් පාලන සභිකයින් සඳහා වෙනම වූ අනුමණ්ඩලයක් පත්කළ හැක.

16.3.6. මෙම මණ්ඩලය හා එහි සාමාජිකයින් සාමූහික මෙන්ම තනිවත් දේශපාලන මණ්ඩලයට හා මධ්‍යම කාරක සභාවට වගකිව යුතු අතර පක්ෂය අරමුණුවලට හා ප්‍රතිපත්ති වලට අනුකූලව කටයුතු කළ යුතුය.

16.3.7. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු ඇතුළු පක්ෂයේ සියලු මහජන නියෝජිතයින් ඔවුනට ලැබෙන විමධ්‍යගත අරමුදල් හා වෙනත් පහසුකම් පක්ෂයේ මධ්‍යම කාරක සභාව නිගමනය කරන සැලසුම්වලට හා නියමයන්ට අනුව යෙදවිය යුතුය.

16.4. නාමයෝජනා කමිටුව:

පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් එක් එක් මැතිවරණ ප්‍රාදේශීය කොට්ඨාශ, පළාත් පාලන හා ඡන්ද කොට්ඨාස සඳහා මැතිවරණ කටයුතුවල නියැලෙන සාමාජිකයන් හඳුනාගෙන ඔවුන් ඒවා භාරව පත් කිරීමට නාමයෝජනා කමිටුවක් පත් කරනු ලැබේ.

16.4.1. පක්ෂ නායක නිල බලයෙන් එහි සභාපති වන අතර ජාතික සංවිධායක මෙහි ලේකම් වේ. ප්‍රධාන ලේකම් ද මෙහි අනිවාර්ය සාමාජිකයන්වේ. මධ්‍යම කාරක සභාව විසින් තවත් සාමාජිකයන් හතර දෙනෙකු මෙම කමිටුවට පත් කළ යුතුය.

<u>හත්වන පරිච්ඡේදය</u>

**17. පක්ෂයේ දේපළ හා මූල්‍ය කටයුතු:**

17.1. වාර්ෂිකව අයවැය වාර්තාවක් සකස් කළ යුතු අතර ඒ පක්ෂයේ භාණ්ඩාගාරික හෝ ඔහු නොමැති විටක විධායක සභාව විසින් ඡන්දයෙන් තෝරා පත් කරගනු ලබන අයෙකු විසින් වසර අවසාන මධ්‍යම කාරක සභාවට ඉදිරිපත් කළ යුතුය. එයට ජාතික සම්මේලනයේ අනුමැතිය ලබාගත යුතුය.

17.2. මුදල් වර්ෂයේ ජනවාරි මස 01 දිනෙන් ඇරඹී දෙසැම්බර් මස 31 වන දිනෙන් අවසන් වේ. ඒ අනුව එකී අයවැය වාර්තාව සම්බන්ධයෙන් පහත ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුවේ.

17.2.1. පක්ෂයේ අයවැය සැකසීම, ගිණුම් තැබීම සහ අවශ්‍යතා මත මුදල් වාර්තා ඉදිරිපත් කිරීම භාණ්ඩාගාරිකගේ වගකීමකි.

17.2.2. පක්ෂයේ ගිණුම මධ්‍යම කාරක සභාව විසින් නම් කරන ස්වාධීන වරලත් විගනකවරයෙකුගේ විගණනය කළ යුතුවේ.

17.3. පක්ෂයට යම් දේපලක් ඇත්නම් එය භාණ්ඩාගාරිකවරයා සාමාජිකයෙකු වන මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත් වූ භාරකාර මණ්ඩලයෙන් පාලනය විය යුතුය.

17.3.1. පක්ෂයේ විසින් සිදුකරන දේපළ හා මූල්‍ය කටයුතුවලදී ගිවිසුම් වලට එළඹීම සඳහා මධ්‍යම කාරක සභාව මගින් පක්ෂ නායක, භාණ්ඩාගාරික හා තවත් තිදෙනෙකුගෙන් යුත් භාරකාර මණ්ඩලයක් යෝජනා කරන අතර පක්ෂය වෙනුවෙන් එළැඹෙන ගිවිසුම් වලදී අත්සන් කිරීම හා නෛතික ක්‍රියාමාර්ග ගැනීම එකී මණ්ඩලයේ කාර්යභාරය වන්නේ ය.

17.4. පක්ෂයේ පොදු ගිණුම පවත්වා ගැනීමේ රීති මධ්‍යම කාරක සභාව විසින් තීරණය කළ යුතුය.

17.5. පක්ෂයේ සඳහා අරමුදල් සාමාජික අරමුදල් පරිත්‍යාග සහ වෙනත් ක්‍රියාකාරකම්වලින් උපයා ගන්නා ධනය රැස් කළ යුතු ය.

18. චංචල හා නිශ්චල දේපළ, මූල්‍ය.

18.1. පක්ෂය විසින් හෝ පක්ෂය වෙනුවෙන් රැස්කළ අරමුදල් සැමවිටම පක්ෂය අභිවෘද්ධිය සහ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා පමණක් යෙදිය යුතු වන්නේය. අන් කිසිදු කරුණක් සඳහා භාවිතා නොකළ යුතු වන්නේය. එසේ වුවත් පක්ෂය පුද්ගලයෙකුහට සද්භාවයෙන් ගෙවන්නා වූ ගෙවීමක් හෝ සේවකයෙකු හෝ අන් අයකු විසින් සාධාරණ ලෙස පක්ෂය වෙනුවෙන් කර ඇති විය පැහැදමක් ප්‍රතිපූර්ණය කිරීමට හෝ බාධාවක් නොමැත්තේය.

18.2. කාලානුරූපීව තීරණය කරන පරිදි පිළිගත් බැංකුවක පිළිගත් ශාඛාවක හෝ වෙනත් මූල්‍ය ආයතනයක ගිණුමක් හෝ ඊට වැඩි ගණනක් විවෘත කර පවත්වාගෙන යායුතු බව මධ්‍යම කාරක සභාව විසින් භාණ්ඩාගාරික, ප්‍රධාන ලේකම් ඇතුළු තවත් තෝරාගත් මධ්‍යම කාරක සභාවේ සාමාජිකයන් දෙදෙනෙකුට අත්සන් කිරීමේ බලය ලිඛිතව ලබා දිය යුතුය. සියලු චෙක්පත් ඉහත කී සාමාජිකයන්ගෙන් දෙනෙකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් අනිවාර්යෙන්ම අත්සන් කළ යුතුය.

18.3. වත්කම් අත්පත් කර ගැනීම:

පක්ෂයට වත්කම් අත්පත් කරගැනීමට නීත්‍යානුකූල අයිතියක් ඇත. අරමුදල් වැය කිරීම මධ්‍යම කාරක සභාවේ පූර්ව අනුමැතිය සහිතව සිදුකළ හැකිය.

18.4. ඔප්පු

වත්කම් සඳහා වන ඔප්පු ඇතුළු අනෙකුත් පැවරීම් ලියකියවිලි නීතියානුකූලව පක්ෂය පහත සඳහන් අයවලුන් වෙත පැවරිය යුතුය.

සභාපති, ප්‍රධාන ලේකම්, භාණ්ඩාගාරික.

පක්ෂය වෙනුවෙන් කිසිදු තනි පුද්ගලයකුට කිසිදු වත්කමක අයිතියක් නො පැවරේ.

18.5. ඉහත සඳහන් දේපොළ සම්බන්ධයෙන් ඒවායේ සඳහන් වත්කම් වල අයිතිය අදාල නිලධාරීන් විසින් භාරයක් ලෙස පක්ෂය වෙනුවෙන් දරා සිටිනු ලැබේ.

18.6. වත්කම් වල අයිතිය

සංවිධානයේ වත්කම් වල අයිතිය කාලානුරූපීව අදාල නිලයන් හොබවන පුද්ගලයන් වෙත පැවරීම සිදු වන අතර ඒ සඳහා අයිතිය පැවරීමේ ලිපියක් හෝ දැනුම් දීමක් හෝ වෙනත් වගකීම් සහතිකයක් ලබා දෙනු නොලැබේ.

18.7. වත්කම් හා ගනුදෙනු

පක්ෂය විසින් බලය පවරනු ලැබූ නිලධාරීන් හට පක්ෂය වෙනුවෙන් එහි වත්කම් විකිණීම, බදු දීම හෝ උගස් කිරීම සිදු කළ හැකි වන අතර ඒ සඳහා අදාළ කරුණු පිළිබඳ කැඳවූ මධ්‍යම කාරක සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් ලබාගත් බහුතර අනුමැතිය තිබිය යුතුය.

18.8. මැතිවරණ කොමිසමේ අනුමැතිය පරිදි සිදු කෙරෙන පක්ෂයේ අනන්‍යයතාවය හා/හෝ පක්ෂයේ නාමය වෙනස් වීමක් නොතකා ආරම්භක පක්ෂය සතුව තිබූ සියලු වත්කම්, වගකීම් නිශ්චල හා චංචල දේපළ අනුපාප්ත්‍රික වන්නා වූ වර්තමාන පක්ෂය සතු වන්නේය.

<u>අටවන පරිච්ඡේදය</u>

19. ව්‍යවස්ථාව සංශෝධනය

19.1. ව්‍යවස්ථා සංශෝධන යෝජනාවන් මධ්‍යම කාරක සභාවේ සාමාජිකයෙකුට ඉදිරිපත් කළ හැකිය.

19.2. ඉහත 19.1. සාමාන්‍යයෙන් ක්‍රියා කරන අවස්ථාවකදී මධ්‍යම කාරක සභාවේ යෝජනා ස්ථිරත්වයෙන් ව්‍යවස්ථා සංශෝධන මණ්ඩලයක් පත් කරනු ලැබේ.

19.3. ව්‍යවස්ථා සංශෝධන ඉදිරිපත් කරන ලද අවස්ථාවකදී එම යෝජනා සමාලෝචනය සඳහා රැස්කරන විශේෂ මධ්‍යම කාරක සභාවකදී සමස්ත සාමාජිකයන්ගෙන් 2/3කගේ අනුමැතියෙන් අනතුරුව අදාළ යෝජනාව පක්ෂ සම්මේලනය මගින් අනුමත විය යුතුය.

19.4. ව්‍යවස්ථා සංශෝධන යෝජනා සමාලෝචනය සඳහා රැස් කරන විශේෂ මධ්‍යම කාරක සභා රැස්වීමේ ක්‍රියාපටිපාටිය මධ්‍යම කාරක සභා රැස්වීමේ දී අනුමත කරනු ඇත.

**20.** ව්‍යවස්ථාව අර්ථ දැක්වීම

20.1. පක්ෂයේ මධ්‍යම කාරක සභාවට ව්‍යවස්ථාවේ ඇති මගහැරීම් සහ දෝෂ නිවැරදි කිරීමේ බලය ඇත්තේ ය. මෙම ව්‍යවස්ථාව අර්ථ දැක්වීමේ දී හා ක්‍රියාත්මක කිරීමේ දී දේශපාලන මණ්ඩලය අවශ්‍ය මාර්ගෝපදේශනය ලබා දෙනු ලබයි. මධ්‍යම කාරක සභාව විසින් සංවිධානයේ රැස්වීම් පවත්වා ගැනීම සඳහා ස්ථාවර නියෝග තැනීම සිදු කළ හැකි අතර, ඒවා මධ්‍යම කාරක සභාව විසින් අනුමත කළ යුතුය.

20.2. මෙම ව්‍යවස්ථාව අනුව අදාළ අවස්ථාවේ වෙනත් කෙනකු නො හැගවේ නම් සැමවිටම සභාපති යනු පක්ෂයේ සභාපති වන අතර ඔහු නොමැති විට වැඩබලන සභාපති වේ. ලේකම් යනු සංවිධානයේ ප්‍රධාන ලේකම් වන අතර ඔහු නොමැති විට වැඩ බලන ලේකම් වේ. භාණ්ඩාගාරික යනු සංවිධානයේ භාණ්ඩාගාරික වන අතර ඔහු නොමැති විට වැඩබලන භාණ්ඩාගාරික වේ.

20.3. ජාතික සමුළුව පැවැත්වීමට නොහැකිවීම.

යම් යම් නොවැළක්විය හේතුවක් හෝ කල් තියා පුරෝකතනය කළ නොහැකි හේතුවක් නිසා පක්ෂයේ ජාතික සමුළුව පැවැත්වීමට මෙම ව්‍යවස්ථානුකූලව නොහැකි වුවහොත් එතැන් සිට පක්ෂය වෙනුවෙන් මධ්‍යම කාරක සභාවේ අනුමැතිය පරිදි කරනු ලබන සියලු කටයුතු නීත්‍යානුකූල සහ බලාත්මක වේ. සභාපති, ප්‍රධාන ලේකම් සහ භාණ්ඩාගාරික යන තනතුරු මීළඟ සමුළුව පවත්වනතුරු බලාත්මක වේ.

<u>නමවන පරිච්ඡේදය</u>

**21.** පොදු රෙගුලාසි

21.1. මෙහි සඳහන් ඕනෑම වගන්තියක අපැහැදිලිතාවක් අතපසුවීමක් හෝ මග හැරීමක් පිළිබඳ ව්‍යවස්ථාවේ නිවැරදි අර්ථකතනය පිළිබඳ ගැටලුවකදී දේශපාලන මණ්ඩලයේ විමසීමෙන් අනතුරුව මධ්‍යම කාරක සභාව ගන්නා බහුතර තීරණය අවසාන තීරණය වේ.

21.2. පක්ෂයේ ජාතික සම්මේලනය, දේශපාලන මණ්ඩලය, මධ්‍යම කාරක සභාව, සියලු කමිටු, ප්‍රාදේශීය සංවිධාන, සියලුම අනුබද්ධ කමිටු ආදී සියලු සභාවල ගන්නා තීරණ අදාල සභාවේ ඇති පුරප්පාඩු හෝ පත්වීම් අඩුපාඩු ගැන නොසලකා එවන් පුරප්පාඩු හෝ පත් කිරීම් වල අඩුපාඩු නොමැති සේ සලකා නීත්‍යානුකූල ලෙස ගත් තීරණ ලෙස සලකනු ලැබේ.

21.3. සියලු රැස්වීම්වල කාර්ය පටිපාටිය සහ රීති.

දේශපාලන මණ්ඩලයේ හැර සංවිධානයේ සියලු රැස්වීම්වලදී යම් විවාදාත්මක කරුණක් සම්බන්ධයෙන් සිදුකරන ඡන්ද විමසීමකදී පැමිණ සිටින සාමාජිකයන්ගේ සරල බහුතරය ප්‍රමාණවත් වේ. කිසිදු සාමාජිකයෙකුට එකකට වැඩි ඡන්දයක් හිමි නොවේ. ඡන්දය සම වූ අවස්ථාවල සභාපතිට දෙවෙනි ඡන්දයකදී තීරණාත්මක ඡන්දයක් හිමි වෙයි.

21.4. ඡන්දය පාවිච්චි කළ හැකි සාමාජික සංඛ්‍යාවෙන් 1/3 ක් මධ්‍යම කාරක සභාවේ සහ අනෙකුත් සියලු සභාවල සන පූර්ණය වේ.

<u>උප ලේඛන:</u>

පළවන උප ලේඛනය:

පක්ෂයේ මැතිවරණ සලකුණ "පැන්සල"

දෙවන උප ලේඛනය:

<u>ප්‍රතිඥාව 01 :</u>

එක්සත් ජනරජ පෙරමුණ පක්ෂයේ සාමාජිකයෙකු වශයෙන් එහි ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා කැප වන බවටත් පක්ෂ ව්‍යවස්ථාව උල්ලංඝනය නොකරන බවටත් පක්ෂයේ මධ්‍යම කාරක සභාව ඇතුළු පක්ෂයේ විවිධ ආයතන මගින් කලින් කලට පනවන නියෝග අතුරු ව්‍යවස්ථා හා අනු නීතිවලට අවනත වී ඒවා අනුගමනය කරන බවටත් පක්ෂය විසින් ගන්නා තීරණ ක්‍රියාත්මක කිරීමට උපරිම සහයෝගය ලබා දෙන බවටත් පක්ෂයට අවමන් වන ආකාරයට හෝ පක්ෂ සාමාජිකයින්ට අනුචිත ආකාරයට කටයුතු නොකරන බවටත් ..................................

(දිවුරුම් දෙන්නාගේ ආගම සඳහන් කරන්න) ලෙසත් ගාම්භීර පූර්වකව ප්‍රතිඥා / දිවුරුම් දී ප්‍රකාශ කර සිටිමි.

<u>ප්‍රතිඥාව 02 :</u>

පක්ෂය නියෝජනය කරමින්.......................................... ධූරය යටතේ පැවරෙන කාර්යය සහ කර්තව්‍යය ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට සහ නීතියට අනුකූලව අවංකව, විවෘත භාවයෙන් යුතුව හා පුරවැසියන්ගේ අභිලාෂයන්ට සංවේදීව ඉටු කරන බවට ද ශ්‍රී ලංකා රාජ්‍යයට පක්ෂපාත වන බවටද උපරිම ශක්ති ප්‍රමාණයෙන් පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ආරක්ෂාකාරීව අනුගමනය කරන බවට ද ගෞරවබහුමානයෙන් යුක්තව ප්‍රකාශ කොට ප්‍රතිඥා දෙමි/ දිවුරුම් දෙමි.

<u>සංශෝධන</u>

**12. පක්ෂයේ නිලධාරීන්**

පක්ෂ නායක, පක්ෂ සභාපති, පක්ෂ ප්‍රධාන ලේකම්, ජාතික සංවිධායක, භාණ්ඩාගාරික, ජ්‍යේෂ්ඨ උප සභාපතිවරු 03 දෙනා, උප සභාපතිවරු 05 දෙනා, නියෝජ්‍ය ලේකම්වරු 11 දෙනා යන අය පක්ෂයේ ප්‍රධාන නිලධාරීන් වේ. පක්ෂයේ යම් නිලධාරියෙක් ඔහු හෝ ඇයගේ වගකීම් සහ ක්‍රියාකාරකම් නිසි පරිදි ඉටුකිරීමට නොහැකි පරිදි අකර්මණ්‍ය වී ඇතැයි දේශපාලන මණ්ඩලය විසින් තීරණය කළහොත්, අදාළ තැනැත්තා නැවතත් රාජකාරි කිරීමට සුදුසු යැයි දේශපාලන මණ්ඩලය තීරණය කරන තුරු, ඔහු හෝ ඇයගේ රාජකාරී ආවරණය කිරීම සඳහා සුදුසු පුද්ගලයකු මීළඟ මහ සභාව තෙක් පත්කිරීමට දේශපාලන මණ්ඩලයට හැකිය. එසේ පත් කරනු ලබන තැනැත්තා අදාළ නිලයේ සියලු වගකීම් සහ රාජකාරි ඉටු කිරීම සඳහා නිල වශයෙන් සුදුසුවේ යනුවෙන් සංශෝධනය කර ඇත.

**14.1. සංයුතිය හා පත්වීම:**

"මධ්‍යම කාරක සභාවේ සාමාජික සංඛ්‍යාව අවම 60 ද උපරිමය 90ක් ද වේ" වගන්තිය වෙනුවට මධ්‍යමකාරක සභාවේ සාමාජිකයින් සංඛ්‍යාව උපරිමය 90 දෙනෙකු වේ යනුවෙන් සංශෝධනය කර ඇත.

15.1.12 අධ්‍යාපන ක්ෂේත්‍ර කටයුතු අනුකම්ටුව.

15.1.13 පළාත් පාලන හා මැතිවරණ කටයුතු අනුකමිටුව.

